(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 36.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0130/'10

1.

ගරු රොෂාන් රණසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂය වන විට මෙරටේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම නම් වශයෙන්, ඒ ඒ දිස්ත්‍රික්ක අනුව කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආරම්භ කරන ලද ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව කවරේද;

(iii) ඒ එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ඇති කිරීමට බලාපොරොත්තු වන ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම කවරේද;

(v) ඒ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0243/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0295/'10

3\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේදී පමණක් රජය ලබාගත් සම්පූර්ණ විදේශ ණය වටිනාකම කොපමණද;

(ii) එකී ණය ලබාගත් මූලාශ්‍ර හා පොලී අනුපාත කවරේද;

(iii) ලබාගත් ණය සඳහා ගිවිසුම්ගත කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂයේදී පමණක් රජය විසින් ආපසු ගෙවන ලද විදේශ ණය වටිනාකම කොපමණද;

(ii) එසේ පොලියත් සමග ආපසු ගෙවූ ණය, ලබාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0304/'10

4\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වත්මන් මැතිවරණ කොමසාරිස්වරයා විශ්‍රාම යන දිනය කවරේද;

(ii) ඔහුගේ වර්තමාන වැටුප කොපමණද;

(iii) විශ්‍රාම යා යුතු වයස පසු කොට ඇති ඔහු තවදුරටත් සේවයෙහි යොදවා ගැනීමෙන් සිදුවී ඇති ඔහුගේ මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මැතිවරණ කොමිසම ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0325/'10

5\.
ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010.05.30 දිනැති සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතේ පළවූ යොමු අංක BOI/EA හා SP/2010/09 දරන දැන්වීම මගින් පැරණි තුල්හිරිය පෙහෙකම්හලේ ඇති යන්ත්‍රෝපකරණ හා කොටස් විකිනීම සඳහා ආයෝජන මණ්ඩලය මිල ගණන් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) තුල්හිරිය පෙහෙකම්හල භාරදී ඇති පාර්ශ්වයේ නම කවරේද;

(ii) භාරදීම සිදු කළ දිනය කවරේද;

(iii) ගනුදෙනුවට අදාල මිල කුමක්ද;

(iv) එය විකිණීමක්ද, කල්බදු ක්‍රමය යටතේ ලබාදීමක්ද;

(v) කල් බදු ක්‍රමයක් නම්, එහි කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් ආකාරයට භාර දෙන ලද භූමි ප්‍රමාණය හා ගොඩනැගිලි කවරේද;

(ii) භාරදෙන ලද යන්ත්‍රෝපකරණ, උපකරණ හා වාහනවල විස්තර කවරේද;

(iii) ඒ සඳහා විවෘත මිල ගණන් කැඳවීමක් සිදුකරන ලද්දේද;

(iv) එසේ නම්, එම මිල ගණන්වල විස්තර කවරේද;

(v) නොඑසේ නම්, මිල ගණන් කැඳවනු නොලැබීමට හේතු කවරේද;

(vi) ඉහත (ආ) (iii) අනුව ලැබුනු මිල යොදවනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0342/'10

6.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජී. එස්. පී. ප්ලස් සහනය යටතේ අප රටින් අපනයනය කරන නිෂ්පාදන වර්ගයන් කවරේද;

(ii) එම නිෂ්පාදන අපනයනය කරන රටවල් කවරේද;

(iii) නිෂ්පාදන යැවීමේදී ලබා දුන් බදු සහනය කොපමණද;

(iv) මෙම සහනය ඉවත් කළහොත් අහිමි වන රැකියා සංඛ්‍යාව කොපමණද;

(v) මෙම සහනය ඉවත් කිරීමෙන් බලපෑමක් ඇතිවන ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විදේශ විනිමය උපයා ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) ජී. එස්. පී. ප්ලස් නොදුන් යුරෝපා රටවලට නිෂ්පාදන යැවීමේ දී සිදු වන පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0356/'10

7.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරගම මහජන ක්‍රීඩාංගනය අයත් රාජ්‍ය ආයතනය කවරේද;

(ii) එම ක්‍රීඩාංගනයේ විශාලත්වය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය විවිධ ක්‍රීඩා තරඟ ජාතික මට්ටමෙන් පැවැත්වීම සඳහා සංවර්ධනය කළ හැකි තරම් ඉඩ ප්‍රමාණයකින් යුත්, යටිතල පහසුකම් ඇති ස්ථානයක පිහිටා ඇති බවත්;

(ii) මීටර් 400 ධාවන පථයක් සකස් කළ හැකි, බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති එකම ක්‍රීඩාංගනය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා 2005 වර්ෂයේ සිට මේ දක්වා, එක් එක් වර්ෂය තුළ,

(i) මධ්‍යම රජය විසින් වෙන්කරන ලද මුදල;

(ii) එයින් වැයකර ඇති මුදල;

(iii) බස්නාහිර පළාත් සභාව විසින් වෙන්කරන ලද මුදල;

(iv) එයින් වැයකර ඇති මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) වර්තමානයේ එම ක්‍රීඩාංගනය කිසිදු ක්‍රීඩාවක් තරඟකාරී ලෙස පැවැත්වීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින් එය සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාව දිය යුතුව ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0372/'10

8.

ගරු නූර්දීන් මෂූර් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1990 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට උතුරු පළාතේ යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවල මුස්ලිම් විවාහ හා දික්කසාද පනත ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 අංක 11 දරන ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීම්) පනත යටතේ පත්කරනු ලැබ සිටි ක්වාසි විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම දිස්ත්‍රික්කවල, ඉහත දිනය වන විට පිහිටුවා තිබූ ක්වාසි අධිකරණ කලාප හෝ බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0401/'10

9.

ගරු දිළුම් අමුණුගම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඊ ගම්මාන ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) එහි නියමු ව්‍යාපෘතිය දියත් කරන ලද පළාත් කවරේද;

(iv) එයට අයත් වූ පාසල්වල නම් කවරේද;

(v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලැබුණු ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය තව දුරටත් පුළුල් ලෙස දියත් කිරීම සඳහා අනාගත සැලසුම් තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0426/'10

10.

ගරු අචල ජාගොඩගේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන පිහිටි වලහන්දුව වත්තෙන් හෙක්ටයාර 19 ක් රුපියල් මිලියන 21 කට විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමතිය හා රජයේ තක්සේරුව ලබා ගෙන තිබේද;

(ii) නීත්‍යානුකූල විකිණුම් කටයුතු කර නොමැති නම්, ඊට වගකිව යුත්තේ කවරෙකුද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගයන් කවරේද;

(iv) මෙහිදී නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ගිවිසුම අවලංගු කොට එම වත්ත නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0471/'10

11.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල්වල මෞලවී ගුරුවරු සහ මෞලවියා ගුරුවරියන් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2009 වර්ෂයේ පත් කරන ලද ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) සියලුම රජයේ පාසල්වල මෞලවී ගුරුවරුන් සහ මෞලවියා ගුරුවරියන් සඳහා තිබෙන සියලු පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0244/'10

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල ,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0331/'10

13\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කරන ලද සමීක්ෂණය අනුව 2002 වර්ෂයේදී, හතර දෙනෙකුගෙන් යුතු පවුලක සාමාන්‍ය මාසික වියදම කොපමණද;

(ii) 2002 සිට 2010 වර්ෂය දක්වා එම වියදම එක් එක් වර්ෂයේ එක් එක් මාසය සඳහා කවරේද;

(iii) 2002 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික ඒක පුද්ගල ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(iv) 2002 වර්ෂයේ සිට මේ දක්වා ජීවන වියදම් දර්ශකයේ සාමාන්‍ය වශයෙන් ගෙවූ ප්‍රමාණය වාර්ෂිකව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0384/'10

14\.

ගරු රවී කරුණානායක මහතා,— වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාලු මුව දොර සිට වැල්ලවත්ත දක්වා මුහුදු ප්‍රදේශය තුළ අක්කර 500 ක් ගොඩ කරනු පිණිස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතින බව සත්‍යයක් දැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කරන්නේ කවරෙක්ද;

(ii) මුහුදු පතුල පිරවීමට යන වියදම කොපමණද;

(iii) එයින් පරිසරයට බලපෑම් ඇති කෙරෙන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ දේශීය හා විදේශීය විශේෂඥ උපදේශකවරු සහ අයෝජකයෝ යන පාර්ශ්ව කවරේද;

(v) එබඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය කුමක්ද;

(vi) ඒ සඳහා වැයකරනු ලබන මුදල ආපසු ගෙවිය යුතු කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0245/'10

15\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.
අභාවප්‍රාප්ත ගරු පී. ඩී. වීරසිංහ ද සිල්වා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.
අභාවප්‍රාප්ත ගරු ඊ. රත්නසභාපති මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.
අභාවප්‍රාප්ත ගරු වී. නවරත්නම් මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

4.
අභාවප්‍රාප්ත ගරු එච්. චන්ද්‍රමන් ද සිල්වා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා,— සිවිල් ගුවන් සේවාව විධිමත් කිරීම, පාලනය කිරීම සහ සම්බන්ධිත කාරණා සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම, අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය බලාත්මක කිරීම සහ ඊට සම්බන්ධ වූ හා ඊට ආනුෂංගික වූ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
පළාත් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*4.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*8.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*9.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

පා. 36/'10

10.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පාර්ලිමේන්තු සේවය, එහි සියලුම අංශවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පවත්වා ගත යුතු ස්වාධීන තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වී ඇති හෙයින්;

(අ) පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම; සහ

(ආ) කාරක සභාව විසින් අදාළ යැයි තීරණය කරනු ලබන අනෙකුත් කරුණු;

යනාදිය පිළිබඳව සොයාබලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, මෙම කාරක සභාව සාමාජිකයින් පස් (05) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යැයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ වත්මන් සහ හිටපු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් හා කාර්ය මණ්ඩල සංවිධානවලින් ලබා ගැනීමට හා භාර ගැනීමට ද;

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට; සහ

(ඈ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට සහ පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද ;

බලය තිබිය යුතු ය.

4. සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර මාස පහ (05) ක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**